(v) උත්තේජ ලෙස ක්‍රියා කරන ශක්තිය හෝ ද්‍රව්‍යය මගින් ප්‍රතිග්‍රාහකයේ පවතින ස්නායු අග්‍රවල විද්‍යුත් විභවයේ වෙනසක් ඇති වේ. එවිට ආවේගයක් ( විද්‍යුත් පණිවුඩයක්) ජනනය වේ. එය මොළයේ ආදාළ ප්‍රදේශයට සම්ප්‍රේෂණය වේ. එවිට උත්තේජය කුමක්දැයි හඳුනා ගනී. ඒ අනුව අදාළ ප්‍රතිචාරය දක්වයි. ඒ සඳහා මධ්‍ය ස්නායු පද්ධතියේ සිට කාරක දක්වා ආවේග යවයි.

a. ප්‍රතිචාරය යනු කුමක් ද?

උත්තේජය හමුවේ දේහය ඊට .............................................................

b. කාරක යනුවෙන් කුමක් අදහස් වේ ද? ...............................................

c. කාරක ලෙස ක්‍රියා කරන්නේ මොනවා ද? ...........................................

<u>අභ්‍යාස</u>

- "ප්‍රනීත ආහාරයක සුවඳ දැනුනු විට කටට කෙළ ඉනීම සිදුවේ." මෙම සංසිද්ධියට අදාළ පහත (a), (b), (c), (d) සඳහා පිළිතුරු සපයන්න.

a) උත්තේජය- ..............................　　c) ප්‍රතිචාරය - ..............................

b) ප්‍රතිග්‍රාහකය- ..............................　　d) කාරකය - ..............................

- "පාදයේ කටුවක් ඇනුනු විට වහා පය ඔසවයි." මෙම සංසිද්ධියට අදාළ පහත (a), (b), (c), (d) සඳහා පිළිතුරු සපයන්න.

a) උත්තේජය- ..............................　　c) ප්‍රතිචාරය- ..............................

b) ප්‍රතිග්‍රාහකය- ..............................　　d) කාරකය- ..............................

- "උණුසුම් වහලක් යට සිටින විට දහඩිය දමයි." මෙම සංසිද්ධියට අදාළ පහත (a), (b), (c), (d) සඳහා පිළිතුරු සපයන්න.

a) උත්තේජය- ..............................　　c) ප්‍රතිචාරය- ..............................

b) ප්‍රතිග්‍රාහකය- ..............................　　d) කාරකය- ..............................

(02) (i) සමායෝජනය සඳහා සංවිධානය වූ එකිනෙකට වෙනස් එහෙත් එකිනෙක හා සම්බන්ධව ක්‍රියා කරන පද්ධති දෙකක් පවතී එම පද්ධති දෙක නම් කරන්න.

a) ..................................................................................

b) ..................................................................................

(ii) ඉහත පද්ධති දෙක මගින් සිදු වන සමායෝජනයන් දෙක සඳහන් කරන්න.

a) ..................................................................................

b) ..................................................................................